museum of modern
and contemporary art
sri lanka

# Quarterly Newsletter #11 – June 2025

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) සිය සංවර්ධනයේ මීළඟ අදියර කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා කොළඹ 3 ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි පිහිටි සිය තාවකාලික පරිශ්‍රයෙන් මාරු වුණු බව සතුටින් දැනුම් දෙයි.

විවිධ දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් පෙළගැස්මක කොටසක් ලෙස, අපගේ නොමිලේ ලබාදෙන ප්‍රදර්ශන සහ ඉගෙනුම් අවස්ථා දිගට ම සංවිධානය වනු ඇත. අපි ඉදිරි වසර දෙක තුළ නූතන හා සමකාලීන කලාව සඳහා කෞතුකාගාරයක් විවෘත කිරීමට, එයට කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට, සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පර්යේෂණ, පුහුණුව, සහ ධාරිතාවය ගොඩ නැංවීම කඩිනම් කරන්නෙමු. අද වන විට කෞතුකාගාර ඉටු කරන කාර්යභාරය පිළිබඳව පුළුල් ප්‍රේක්ෂක දැනුවත්භාවයක් ගොඩ නැගීම සඳහා පාසල් සහ කලා ප්‍රජාව සමඟ ඇති නියැලීම වැඩි කිරීමට MMCA ශ්‍රී ලංකා බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ක්ෂේත්‍රය පුරාවට වෘත්තීය ධාරිතාවය ගොඩ නැගීම සඳහා නිර්මාණය කර ඇති පුහුණු වැඩසටහනක් වන ‘කෞතුකාගාර තීව්‍ර’ වැඩසටහනේ (MI 3) තුන්වන සංස්කරණය මාර්තු 10 සහ 11 යන දිනවලදී අපි පැවැත්වූවෙමු. MI 3 වැඩසටහන ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය (IPM) සහ, ලේඛනාගාර ද්‍රව්‍ය පිරිසිදු කිරීම සහ ගබඩා කිරීම කෙරෙහි අවධානය යොමු කළේ ය.

ලෝක ස්මාරක අරමුදල හා සමීප හවුල්කාරීත්වයෙන් ගොඩ නැගුණු මෙම දෙදින වැඩමුළුව මෙහෙයවන ලද්දේ එක්සත් රාජධානියේ City & Guilds of London Art Schoolහි උපදේශක හා එක්සත් රාජධානියේ ජාතික භාරකාර මණ්ඩලයේ කඩදාසි සහ ඡායාරූපකරණය පිළිබඳ ජ්‍යේෂ්ඨ සංරක්ෂක නිකොලා වෝකර් ACR විසිනි.

MMCA ශ්‍රී ලංකා කණ්ඩායමේ සාමාජිකයන්ට අමතරව මෙම වැඩමුළුවට ජාතික කලා ගැලරිය, ඓතිහාසික සංවාද සහ මතකය සඳහා වූ සමූහිකය, ලයනල් වෙන්ඩ්ට් කලා මධ්‍යස්ථානය, කියුරාඩෝ කලා අවකාශය, ෆොටෝ ඩිසයින්, ශ්‍රී ලාංකේය සමකාලීන කලා, වාස්තු විද්‍යා සහ පිරිසැකසුම් ලේඛනාගාරය, සහ යාපනය විශ්ව විද්‍යාලය යන ආයතනවල කාර්ය මණ්ඩල සාමාජිකයන් සමඟ ශ්‍රී ලංකාව පදනම් කරගත් ස්වාධීන සංරක්ෂකයින් දෙදෙනෙකු ද ඇතුළත් විය.

ඉරුෂි තෙන්නකෝන්, සුමේධ කැලේගම, සහ සුමුදු අතුකෝරළ විසින් කළ ‘is this an architectural documentary?’ (2023) සජීවිකෘත වාර්තා චිත්‍රපටයට, වාස්තු විද්‍යා ඉතිහාසඥයන්ගේ සංගමයේ (SAH) ගෞරවනීය ‘චිත්‍රපට සහ වීඩියෝ සඳහා වන 2025 SAH සම්මානය’ ලැබී ඇති බව අපි ඉතා සතුටින් දැනුම් දෙමු. මෙම චිත්‍රපටයේ කෙටි සංස්කරණයක් දහනව වැනි වෙනීස් වාස්තු විද්‍යා බියනාලයේ කටාර් ජාතික මණ්ඩපයේ කොටසක් ලෙස සංදර්ශිත ය. ‘Beyti Beytak, My home is your home, La mia casa è la tua casa’ ලෙසින් නම් කෙරුණු මෙම මණ්ඩපය 2025 නොවැම්බර් 23 දක්වා පලාසෝ ෆ්‍රැන්චෙට්හී විවෘතව ඇත.

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

මෙම සජීවිකරණ චිත්‍රපටය සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඩිජිටල් සහයෝගීතා අරමුදල අනුග්‍රහය ලබාදුන් අතර, එය එක්සත් රාජධානියේ සහ විදෙස් සංස්කෘතික හවුල්කාරීත්වවලට ඩිජිටල්මය නව සහයෝගීතා ක්‍රම ගොඩ නැගීම සඳහා සහය වේ. වාර්තා චිත්‍රපටය සඳහා පර්යේෂණ සහ සංවර්ධන සහය ලබා දුන්නේ එක්සත් රාජධානියේ Forensic Architecture විසිනි.

අපගේ ආදිකර්තෲ අනුග්‍රාහකයන් වෙනුවෙන් වූ අභිරක්ෂිත කලා සංචාරවල කොටසක් ලෙස, අප්‍රේල් 16 සිට 20 වනදා දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සංචාරයක් MMCA ශ්‍රී ලංකා සංවිධානය කළේ ය. සහභාගිවූවන්ට එම කළාපයේ ප්‍රධාන බියනාලේ සහ කලා පොළවල් නැරඹීමට යාමට ද, ආර්ට් ඩුබායි, අල්සර්කාල් පදනම, ගගන්හයිම් අබු ඩාබි, ලූව් අබු ඩාබි, ශාජා කලා පදනම, සහ ආර්ට් ජමීල් යන උළෙලවල් හා ආයතන ඇතුළු තවත් තැන් බොහොමයක සුහද හමුවීම් හා සංචාරවලට සහභාගී වීමට අවස්ථාව ලැබුණි.